// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2101/20 – 2018 දෙසැම්බර් මස 12 වැනි බදාදා – 2018.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාවේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් විෂය භාර අමාත්‍ය ගුණතිලක වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මම මෙහි පළ කරනු ලබන 2018 අංක 01 දරන දකුණු පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය, දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද 2018.11.29 වැනි දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් දැනුම් දෙමි.

**ගුණතිලක වඩු ෂාන් විජයලාල් ද සිල්වා,**
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය,
සංචාරක හා ඉංජිනේරු සේවා අමාත්‍ය.

2018 දෙසැම්බර් මස 05 වැනි දින,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.
ගාල්ල.

1A – PG 4334 – 10 (2018/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**දකුණු පළාතේ 2018 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය**

**දකුණු පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ, පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය.

1. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ 2018 අංක 01 දරන දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

දකුණු පළාතේ 1990 අංක 7 දරන මුදල් ප්‍රඥප්තියේ 104 අ වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන) 1992 අංක 02 දරන දකුණු පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත වූ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 104අ වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පළාත් දිරි ගැන්වීමේ අරමුදල් ගිණුම පිහිටුවීම.

104අ (1) මේ වගන්තියේ මින් මතු ''ගිණුම'' යනුවෙන් සඳහන් කරනු ලබන ''පළාත් දිරිගැන්වීමේ අරමුදල් ගිණුම'' යනුවෙන් හැඳින්වෙන ගිණුමක් පිහිටුවා පවත්වා ගත යුතු ය.

අරමුණ.

(2) ගිණුම පවත්වා ගෙන යාමේ අරමුණ පහත ආකාරයට වන්නේ ය.

(අ) පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන ප්‍රඥප්ති කාර්යක්ෂම ලෙස පරිපාලනය කරනු ලැබීම සහතික කිරීම අරභයා පළාත් ආදයම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් උදෙසා දිරිගැන්වීමේ දීමනා ලබා දීම.

(ආ) පළාත් ආදයම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් අවශ්‍ය සුභසාධන කටයුතු සඳහා අවශ්‍ය වන මුදල් ලබා දීම.

ගිණුමේ පරිපාලනය.

(3) මෙම ගිණුම පරිපාලනය සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් සිදුවිය යුතු අතර එහි සංයුතිය පහත ආකාරයෙන් විය යුතු ය.

(අ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්,
(ආ) දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්,
(ඇ) දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)
(ඈ) ගාල්ල දිස්ත්‍රික් ලේකම්,
(ඉ) පළාත් ආදයම් කොමසාරිස්වරයා සහ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය ලබාදෙන පළාත් ආදයම් සේවයේ නියෝජ්‍ය කොමසාරිස්වරුන් දෙදෙනෙකු.

(4) ගිණුමේ කටයුතු හා පරිපාලනය සම්බන්ධව තීරණ ගැනීමේ දී කමිටුවේ සාමාජිකයින් පස් දෙනෙකුගේ අනුමැතියෙන් එම තීරණ බලාත්මක කළ හැකි ය.

(5) (අ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ නමින් රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් ලෙස ගිණුම පවත්වාගෙන යා යුතු ය.

(ආ) සෑම ලිත් වර්ෂයක් අවසානයේ ගිණුමේ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාවක් අනුගාමික මුදල් වර්ෂයේ මාර්තු මස තිස් එක දිනයට පූර්වයෙන් කොමසාරිස්වරයා විසින් පිළියෙල කොට ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

ගිණුමට මුදල් උපයා ගන්නා ආකාරය.

(6) ආරම්භක මුදල වශයෙන් රුපියල් ලක්ෂයක මුදලක් පළාත් සභා අරමුදල මගින් මෙම ගිණුමට ලබාදීමෙන් ගිණුම ආරම්භ කළ යුතු ය.

(7) පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන තත්කාලීන ප්‍රඥප්ති යටතේ පළාත් සභා අරමුදලට බැර වන ආදයමින් පහත (අ) සහ (ආ) මගින් විස්තර වන ආදයම් ශීර්ෂයන්ගෙන් එහි සඳහන් ප්‍රතිශතයන්ට යටත් වූ මුදල් ප්‍රමාණයක් පළාත් සභා අරමුදලින් අර්ධ වාර්ෂිකව මෙම ගිණුමට බැර කළ යුතු ය.

(අ) පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක සඳහන් විධිවිධානවලට අනුව යම් තැනැත්තෙකු විසින් ගෙවිය යුතු බවට නියම කර ඇති බද්දක් හෝ ගාස්තුවක් නියමිත කාලයේ දී නිසි පරිදි ගෙවා නොමැති අවස්ථාවක ක්‍රියාත්මක වී එම නියමිත බද්ද හෝ ගාස්තුව ආදයමක් ලෙස රැස්කර ගනු ලැබූ අවස්ථාවක සහ

පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ ඉදිරිපත් කළ යුතු බවට එකී ප්‍රඥප්ති මගින් නියම කර ඇති වාර්තා නොසැපයීම සහ යම් වාර්තාවක ප්‍රකාශ කර ඇති පිරිවැටුම, යම් සාධන පත්‍රයක ප්‍රකාශ කර ඇති වටිනාකම, ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පරීක්ෂා කිරීමේ දී අසත්‍ය ලෙස ප්‍රකාශ කර ඇති බවට තහවුරු වීම යන කරුණ මත තක්සේරුකරුවකු විසින් කරනු ලබන තක්සේරුවක් සහ

සාධන පත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව පිළිබඳව 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 62 වගන්තිය යටතේ නිකුත් කළ මත ප්‍රකාශයක් මගින් ආදයම රැස්කරගනු ලැබ ඇති අවස්ථාවක එලෙස රැස්කරගනු ලබන ආදායමෙන් සියයට දොළහයි දශම පහක් (12.5%) ද,

(ආ) පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ පනවනු ලබන දඩ සහ දණ්ඩන මගින් රැස්කරනු ලබන ආදයමෙන් සියයට පහක් (5%) ද ගිණුමට බැර කළ යුතු ය.

(ඇ) ඉහත (අ) හා (ආ) කරුණු යටතේ පළාත් සභා අරමුදලට රැස්කරන ලද මුදල සම්බන්ධයෙන් ලේඛන කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

(8) ගිණුම පරිපාලනය සඳහා වූ කමිටුව විසින් පහත කරුණු සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණයන් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා දිය යුතු ය. ගිණුමින් කරනු ලබන ගෙවීම්.

(අ) ගිණුම පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අර්ධ වර්ෂයකට වරක් පළාත් ආදයම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ලබා දෙන දිරි දීමනා සහ වැටුප් සංශෝධනයන් හි දී උද්ගත වන හිඟ දිරි දීමනාව,

(ආ) නිලධාරීන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණ,

(9) එක් එක් ලිත් වර්ෂයට අදළ ව ඉහත (8) උපවගන්තිය යටතේ දක්වෙන වියදම් පියවා ගැනීමෙන් අනතුරුව රුපියල් ලක්ෂ දහයක මුදලක් ගිණුම තුළ රඳවා ඉතිරිවන මුදල් ප්‍රමාණය වර්ෂ අවසානයේ පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

(10) මෙම ගිණුම යටතේ වන මුදල් ගිණුමින් ඉවත්කර ගැනීම සඳහා වන චෙක්පත් හෝ අණකර ප්‍රධාන ලේකම් විසින් ඒ සඳහා නිශ්චිතව බලය ලබාදෙන නිලධාරීන් දෙදෙනෙකු විසින් කළ යුතු ය.

(11) මෙම ගිණුම සම්බන්ධව එක් එක් ලිත් වර්ෂය සඳහා පිළියෙළ කරන අවසන් ගිණුම් වාර්තා 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියෙහි 102 වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව විගණකාධිපතිවරයාගේ විගණනයට යටත්ව පවත්වා ගත යුතු ය. සාමාන්‍ය කරුණු.

(12) (අ) ගිණුම ක්‍රියාත්මක කිරීමට අදළ කාර්ය පටිපාටි නියම කිරීම සඳහා ද, ආකෘති පත් නියම කිරීම සඳහා ද, ඊට අනුශාංගික කරුණු සඳහා ද කොමසාරිස්වරයාගේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් කලින් කලට කාර්ය පටිපාටික රීති නියම කළ හැකි ය.

(ආ) ඉහත (අ) යටතේ සාදන ලද කාර්ය පටිපාටික රීති අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කළ යුත්තේ ය.

3. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

12 - 761

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.